සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

Learning Resource Cell R De Mazenod College Kandana 44627

**වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)**
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 06 | බුද්ධ ධර්මය | I, II | පැය 2 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු සඳහා මෙම පත්‍රයෙහි ම පිළිතුරු සපයන්න.

01. අප මහා බෝසතාණන් වහන්සේ මනුලොව ඉපදීමට පෙර උපත ලබා සිටියේ,
    1. ශක්‍ර භවනෙහි ය. 2. බඹ ලොවෙහි ය. 3. තුසිත දෙව්ලොවෙහි ය. 4. යාම දෙව්ලොවෙහි ය.
02. සිදුහත් බෝසතාණන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණය සිදුකරන විට උන්වහන්සේගේ වයස අවුරුදු,
    1. 16 කි. 2. 20 කි. 3. 25 කි. 4. 29 කි.
03. සත්‍ය සොයා යන සිදුහත් බෝසතුන්ට බිම්බිසාර රජතුමා කළ ආරාධනාව වූයේ කුමක් ද?
    1. පළමු ධර්ම දේශනාව තමාට සිදු කරන ලෙස ය.
    2. බුදු බව ලබා පළමු ව තම රාජ්‍යයට වඩින ලෙස ය.
    3. ප්‍රථම ආරාම පූජාව සිදු කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ය.
    4. තමන්ට පළමුව පැවිද්ද ලබාදෙන ලෙස ය.
04. ත්‍රිවිද්‍යා ඥාන අතර 'ආසවක්ඛය ඤාණය' යනු,
    1. පෙර ආත්මභාවයන් සිහිකරන නුවණයි.
    2. සත්ත්වයාගේ උපත හා මරණය සිදුවන ආකාරය දැකීමේ නුවණයි.
    3. සියලු කෙලෙසුන් නසන නුවණයි.
    4. දෙව්ලොව දැක ගැනීමට හැකි නුවණයි.
05. සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම සිදු වූ පොහොය දිනය වූයේ,
    1. වෙසක් පොහොය දිනයයි. 2. ඇසළ පොහොය දිනයයි.
    3. මැදින් පොහොය දිනයයි. 4. පොසොන් පොහොය දිනයයි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

06. නිබ්බුත පද ප්‍රකාශ කරනු ලැබුවේ පටාචාරාවන් ය. ( )
07. "සුඛෝ බුද්ධානං උප්පාදෝ" යන්නෙහි අදහස "බුදු උපත සැපතකි" යන්නයි. ( )
08. චත් පුරන්නාගේ සිල් පිරේ. ( )
09. පිරිමි සිසු දරුවකු භාවනා කිරීමේ දී සිටිය යුතු ඉරියව්ව වන්නේ අර්ධ පර්යංකයයි. ( )
10. ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුරු ලැබුවේ රාහුල පොඩි හාමුදුරුවන් ය. ( )

- 'A' කාණ්ඩයේ ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර 'B' කාණ්ඩයෙන් තෝරා වරහන් තුළ ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය යොදන්න.

| A | B |
|---|---|
| 11. නරසීහ ගාථා ප්‍රකාශ කිරීම | (......) (A) ආර්ය අෂ්ටාංගික මාර්ගය |
| 12. දියුණු වීමේ දොරටු හයක් දක්වා ඇත | (......) (B) කීර්තිය පැතිරීම |
| 13. සසර දුකින් අත්මිදීමට උපකාර වන මාර්ගය | (......) (C) ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය |
| 14. සිල්වත්ව කටයුතු කිරීම | (......) (D) අත්ථස්සද්වාර ජාතකය |
| 15. සෑම සිල් පදයක් ම අංශ තුනකින් ආරක්ෂා කිරීම | (......) (E) යශෝදරා දේවිය |

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. සිගාලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ (දීඝජානු කෝලිය පුත්‍රයාට/ සිගාලක ගෘහපති පුත්‍රයාට) ය.
17. හොඳ - නරක, කුසල - අකුසල හඳුනා ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍රය වන්නේ (රතන සූත්‍රය/ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය) යි.
18. දිවා රාත්‍රී පින් වැඩෙන යහපත් ක්‍රියාවන් ලෙස බුදු දහමේ සඳහන් වන්නේ (ගොඩනැගිලි නිර්මාණය කිරීම/ මල් වතු උයන් වැවීම) ය.
19. අනුබුදු මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩම කරන විට ලංකාවේ පාලකයා ව සිටියේ (දුටුගැමුණු රජතුමා/ තිස්ස රජතුමා) ය.
20. ශ්‍රද්ධාවේ ප්‍රධාන ප්‍රභේද (දෙකකි/ තුනකි). (ලකුණු 2 x 20 = 40කි)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරකට (සියල්ල පහකි) පිළිතුරු සපයන්න.**

01. තුන්වන වාරයේ ඔබ විසින් පන්ති කාමරය තුළ දී සිදු කරන ලද ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
    1. ඔබ ඇගයීම සඳහා තෝරාගත් පාඩමෙහි නම ලියන්න.
    2. ඔබ ඇගයීම සඳහා සිදු කළ ක්‍රියාකාරකම කුමක් ද?
    3. ඔබට ක්‍රියාකාරකම සිදු කිරීමට සහය දුන් දෙදෙනෙකු නම් කරන්න.
    4. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ඔබ ලබා ගත් ප්‍රයෝජන දෙකක් ලියන්න.
    5. මෙම ඇගයීම සිදු කිරීම සඳහා ඔබ පුහුණු වූ ආකාරය වාක්‍ය දෙකකින් ලියන්න.
    6. ජාතක කතා පොත රචනා කළ යුගය කුමක් ද?
    7. ජාතක පොතෙහි ඇතුළත් ජාතක කතා ගණන කීයද?
    8. ඇගයීම සඳහා ඔබට නියමිත පාඩමෙහි සඳහන් ජාතක කතාව කුමක් ද?
    9. එම ජාතක කතාවෙහි ඇතුළත් චරිත දෙකක් ලියන්න.
    10. එම ජාතක කතාවෙන් ලබා දෙන ප්‍රධාන උපදේශය ලියන්න. (ලකුණු 2 x 10 = 20)

02. 1. සහම්පතී මහා බ්‍රහ්මයා බෝසත් දිව්‍යරාජයාට මනුලොව උපදින්නට යැයි ආරාධනා කළ ගාථාව ලියන්න.
    2. ඉහත සඳහන් කළ ගාථාවේ තේරුම ලියන්න.
    3. සිදුහත් බෝසත් සිරිතෙහි සිදු වූ වැදගත් සිදුවීම් පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)

03. 1. විහාරස්ථානයක් වන්දනා කිරීමට යෑමේදී බෞද්ධ දරුවන් අනුගමනය කරන චාරිත්‍ර දෙකක් ලියන්න.
    2. පන්සිල් පදවල දෙවන හා හතරවන සිල් පද දෙක පිළිවෙලින් ලියන්න. (පාලි භාෂාවෙන්)
    3. පන්සිල් ආරක්ෂා කිරීමෙන් ඔබේ ජීවිතයට සිදුවන යහපත පිළිබඳ කරුණු පහක් ලියා දක්වන්න. (ලකුණු 2+3+5 = 10)

04. 1. 'චාරිත්‍ර' යනු මොනවා ද?
    2. ත්‍රිශික්ෂාව නම් කරන්න.
    3. යහපත් වචන කතා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)

05. 1. සිගාලෝවාද සූත්‍රයෙහි දෙමව්පියන් හඳුන්වා දී ඇති දිසාව කුමක් ද?
    2. දෙමව්පියන් සිව්බඹ විහරණවලින් යුක්ත ය. එම විහරණවලින් තුනක් ලියන්න.
    3. සිගාලෝවාද සූත්‍රයට අනුව දෙමව්පියන් වෙනුවෙන් දූදරුවන් සිදු කළ යුතු යුතුකම් පහ ලියා දක්වන්න. (ලකුණු 2+3+5 = 10)

06. 1. "තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති..." යන ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
    2. ඉහත ගාථාවේ තේරුම ලියන්න.
    3. හොඳ ක්‍රියා සිදුකිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පහක් ලියා දක්වන්න. (ලකුණු 2+3+5 = 10)

07. 1. අනුබුදු මිහිඳු මාහිමියන් ලංකාවට වැඩම කළ පොහොය දිනය නම් කරන්න.
    2. අනුබුදු මිහිඳු මාහිමියන් සමඟ පැමිණි ධර්මදූත පිරිසෙන් තිදෙනෙකු නම් කරන්න.
    3. මහින්දාගමනය නිසා ශ්‍රී ලාංකික අපට ලැබුණු දායාද පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)